# පුරාණ ලංකාවේ පැවති ආගම් හා ඇදහිලි

ආර්. පී ගිත්මි ප්‍රසන්සනී
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
gith.rubasinghe@gmail .com

**සංක්ෂේපය**

මහින්දාගමනයත් සමඟ ලංකාවේ ප්‍රධාන ආගම බවට බුද්ධාගම පත් විය. නමුත් ප්‍රාග් බෞද්ධ යුගයේ දී බුදුදහමට අමතරව ලංකාව තුළ වෙනත් ආගම්, ඇදහිලි හා විශ්වාස තිබූ බව මූලාශ්‍රයවලින් හෙළිවේ. ඇතැම් විට එම ආගම් හා පුද පූජා බුදු දහම තරමටම දියුණු නොවුණ ද ඒවා ලංකාවේ දේශපාලනික, සංස්කෘතික හා ආගමික ඉතිහාසය හැඩගැස්වී මෙහිලා බෙහෙවින් හේතු වී ඇත.

පැරණි ලංකාවේ පැවති ආගම් හා පුද පූජා පිළිබඳව සහ ඒවා ලංකා සමාජය තුළ කොතෙක් දුරට මුල් බැසගෙන තිබුණේද යන්න පිළිබඳව මෙන්ම එම ආගම් හා පුද පූජා ලංකා සමාජය හැඩගැස්වීමේලා කෙතෙක් දුරට බලපෑවේ ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙහිදී ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය උපයෝගී කර ගෙන තිබේ.

ලංකාවේ දේශපාලනික, සංස්කෘතික හා ආගමික ඉතිහාසය හැඩගැස්වීමේලා බුදු දහමට අමතර වෙනත් ආගම් හා ඇදහිලි බොහෝමයක් පැවති බව කිව හැකිය. විශේෂයෙන් ජෛන, පරිබ්‍රාජක, ආජීවක, බමුණු බලපෑම මෙන්ම හිරු සඳු පිදීම, ලිංග වන්දනය, ජගත් මාතා පිදීම, ශිව වන්දනය, නාග වන්දනය, මළවුන් පිදීම, වෘක්ෂ වන්දනය, දේව කොට්ඨාස පිදීම මෙන්ම විවිධ ආගමික උත්සව හා පුද පූජා ද ඒ අතර වේ. මේ ආගම් හා පුද පූජා යම් යම් මට්ටමින් ලාංකීය සමාජය තුළ මුල් බැස ගත් අතර එහි බලපෑම විවිධ මට්ටමින් ලාංකීය සමාජයට ලැබුණි. එම නිසා ලංකාවේ දේශපාලන, සංස්කෘතික, ආගමික ඉතිහාසය හැඩගැස්වීම සඳහා මෙම ආගම් හා පුද පූජා නොයෙක් ආකාරයෙන් උපකාරී වූ බව නිසැකවම කිව හැකිය.

**ප්‍රමුඛ පදඃ- ආගම, විශ්වාස, පුද පූජා**